සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

## විද්‍යාව

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකය: |
|---|

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් ද්‍රව්‍ය ආලෝකයේ ගමන් මග හරහා තැබූ විට පැහැදිලි ඡායාවක් ඇති කරන ද්‍රව්‍ය කුමක් ද?
 (1) පොලිතීන් කැබැල්ල (2) අවර්ණ වීදුරු කැබැල්ල
 (3) කාඩ්බෝඩ් කැබැල්ල (4) පිරිසිදු ජලය

02.



 A හා C අනුපිළිවෙලින් දක්වෙන්නේ,
 (1) ආලෝක කිරණයක් හා අපසාරී කදම්බයක්
 (2) සමාන්තර කදම්බයක් හා අභිසාරී කදම්බයක්
 (3) ආලෝක කිරණයක් හා සමාන්තර කදම්බයක්
 (4) සමාන්තර කදම්බයක් හා ආලෝක කිරණයක්

03. පෘථිවියේ ස්ථර ඉහළ සිට පහළට පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.
 (1) කබොල, හරය, ප්‍රාවරණය (2) හරය, කබොල, ප්‍රාවරණය
 (3) ප්‍රාවරණය, හරය, කබොල (4) කබොල, ප්‍රාවරණය, හරය

04. දකුණුපස රූපයේ දක්වෙන්නේ,

 (1) භූතැටි එකිනෙක ඈත්වීමයි.
 (2) භූතැටි එකිනෙක තුලට චලනය වීමයි.
 (3) භූතැටි එකිනෙක මත ලිස්සා යාමයි.
 (4) භූ තැටි කම්පනය වීමයි.

05. පහත රූපයේ දක්වෙන්නේ දෙබෙදුම් සුචියකි.
 a හා b සඳහා සුදුසු පිළිතුර අනුපිළිවෙලින් දක්වෙන වරණය කුමක් ද?



 (1) පියාපත් නැත, කටුස්සා
 (2) කරමල් නැත, මාළුවා
 (3) විවිධ වර්ණ ඇත, කටුස්සා
 (4) පාට මාරුකල හැක, මාළුවා

06. මාළුවාගේ හා කුරුල්ලාගේ ශරීරවල හඳුනාගත හැකි බාහිර පොදු ලක්ෂණය වන්නේ,
 (1) සමේ ස්වභාවය සමාන වීම. (2) ප්‍රජනන ක්‍රමය සමාන වීම.
 (3) අනාකූල ශරීරයක් තිබීම. (4) සමාන සංචරණ උපාංග තිබීම.

07. දකුණු පස දක්වෙන සංකේතවලින් නිරූපණය වන උපාංග පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.
 (1) වියළි කෝෂය හා ධාරිත්‍රකය
 (2) ධාරිත්‍රකය හා වියළිකෝෂය
 (3) වියළි කෝෂය හා ස්විචය
 (4) ස්විචය හා ධාරිත්‍රකය


08. භූගත කඳක ආහාර සංචිත වී ඇත්තේ,
 (1) කැරට් ශාකයේය. (2) බතල ශාකයේ ය. (3) ලූණු ශාකයේ ය. (4) මඤ්ඤොක්කා ශාකයේ ය.

09. තාප විදුලි බලාගාරයක සිදුවන ශක්ති පරිවර්තනය ගැලීම් සටහනකින් පහත දක්වේ

රසායනික ශක්තිය ⟶ තාප ශක්තිය ⟶ ................................ ⟶ විද්‍යුත් ශක්තිය

මෙහි හිස්තැනට සුදුසු වචනය තෝරන්න.
(1) ආලෝක ශක්තිය (2) ධ්වනි ශක්තිය (3) චුම්බක ශක්තිය (4) චාලක ශක්තිය

10. තලදර්පණවලින් ඇතිවන ප්‍රතිබිම්භවල ලක්ෂණයක් නොවන්නේ
(1) උඩුකුරු වීම. (2) තිරයකට ගතහැකි වීම.
(3) වස්තුවට සමාන වීම. (4) අතාත්වික වීම.

11. එක්තරා පාසලක සංගීත කාමරය තුළ සංගීත භාණ්ඩ A B C D ලෙස කට්ටල 4 කට වෙන්කොට ගබඩා කර තිබුණි.

| A කට්ටලය | B කට්ටලය | C කට්ටලය | D කට්ටලය |
|---|---|---|---|
| වයලීනය<br>ගිටාරය | බෙරය<br>තබ්ලාව<br>රබාන | බටනලාව<br>හක්ගෙඩිය<br>සර්පිනාව | තාලම්පට<br>පන්තේරුව |

ඉහත කට්ටල අතුරින් වාත කඳන් කම්පනයෙන් ධ්වනිය නිපදවන සංගීත භාණ්ඩ අඩංගු කට්ටලය වනුයේ,
(1) A (2) B (3) C (4) D

12. වායුගෝලයේ ප්‍රධාන ස්ථර පොළවමට්මේ සිට ඉහළට පිහිටන ආකාරය නිවැරදි ලෙස දක්වෙන පිළිතුර තෝරන්න.
(1) පරිවර්තිගෝලය, ස්තර ගෝලය, තාප ගෝලය, මධ්‍ය ගෝලය, බහිර් ගෝලය
(2) ස්තර ගෝලය, තාප ගෝලය, පරිවර්ති ගෝලය, බහිර් ගෝලය, මධ්‍ය ගෝලය
(3) පරිවර්ති ගෝලය, ස්තර ගෝලය, මධ්‍ය ගෝලය, තාප ගෝලය, බහිර් ගෝලය
(4) මධ්‍ය ගෝලය, ස්තර ගෝලය, පරිවර්ති ගෝලය, බහිර් ගෝලය

13. නටන ජලයේ උෂ්ණත්වය නිවැරදි ලෙස දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) 373 K (2) $373\ K^{0}$ (3) $100\ C^{0}$ (4) $212\ F^{0}$

14. ලෝහ දණ්ඩක තැබූ ඉටි බින්දු මත අල්පෙනෙත්ති සවිකර එහි එක් කෙළවරක් ඉටිපන්දම් දැල්ලකින් රත්කරන ආකාරය පහත දක්වෙයි. (අල්පෙනෙත්ති කටු A B C D ලෙස නම් කර ඇත.)
ඉහත ක්‍රියාකාරකම ආශ්‍රිත නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(1) පළමුවෙන්ම D අල්පෙනෙත්ත පොළවට වැටෙයි.
(2) මෙම ලෝහ කූර දිගේ තාපය ගමන්ගන්නේ සන්නයනයෙනි.
(3) ඉටිපන්දමේ උෂ්ණත්වය ලෝහ කූර දිගේ ගමන් කරයි.
(4) ලෝහ කූර වෙනුවට පැන්සලක් යොදා ගත්ත ද මෙම ප්‍රතිඵලයම ලැබේ.

15. ගෙවත්තෙන් ලබාගත් පස් සාම්පලයක් බීකරයකට දමා ජලය ස්වල්පයක් දමා හොඳින් සොලවයි. ඉන්පසු මෙම බීකරය දින කිහිපයක් නිශ්චලව තැබූවිට පසේ සංඝටක වෙන්වීම ඉහළ සිට පහළට දිස්වන ආකාරය දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) රොන්මඩ, මැටි, බොරළු, රළුවැලි (2) බොරළු, රොන්මඩ, රළුවැලි, මැටි
(3) රළුවැලි, බොරළු, රොන්මඩ, මැටි (4) මැටි, රොන්මඩ, රළුවැලි, බොරළු

16. ශිෂ්‍යයෙක් සරල රේඛීය මාර්ගයක් දිගේ A සිට B දක්වා ගමන්කරයි. ඉන්පසු නැවත එම මාර්ගයේම ආපසු C නම් ස්ථානයකට පැමිණ නතරවේ. එම තොරතුරු පහත සටහනේ දක්වෙයි.
ශිෂ්‍යයා සිදුකළ විස්ථාපනය කොපමණ ද?




(1) 12 m (2) 100 m (3) 75 m (4) 25 m

17. බලය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බලය මනිනුයේ පැස්කල් වලිනි. (2) බලයට විශාලත්වයක් හා දිශාවක් ඇත.
(3) බලය යොදන හැම විටම වස්තු චලනය වේ. (4) වස්තුවක හැඩය වෙනස් කිරීමට බලයකට නොහැක.

18. ශිෂ්‍යයකුගේ ආහාර වේලෙහි බත් සහ සෝයා බෝංචි දක්නට ලැබුණි. එම ආහාරවල පෝෂණ සංඝටක නිවැරදි අනුපිළිවෙලට දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) ප්‍රෝටීන්, ලිපිඩ (2) ලිපිඩ, කාබෝහයිඩ්රේට්
(3) කාබෝහයිඩ්රේට්, ප්‍රෝටීන් (4) ප්‍රෝටීන්, ලිපිඩ

19. ගිනිකඳු පිපිරීමත් සමග පොලව මතුපිටට ලාවා පැමිණේ. මෙම ලාවා පොලව මතුපිටට පැමිණ සිසිල්වීම නිසා සෑදෙන පාෂාණවල නම කුමක් ද?
(1) කිරිගරුඬ (2) හුණුගල් (3) ග්‍රැනයිට් (4) මඩගල්

20. මෑත කාලීනව ශ්‍රී ලංකාව බරපතල ශක්ති අර්බුදයකට මුහුණ පායි. මෙයට පිළියමක් ලෙස මුළු දිවයිනම ආවරණය වන ලෙස භාවිත කළ හැකි වඩාත් සුදුසු ශක්ති ප්‍රභවය කුමක් ද?
(1) සුළං බලය (2) සූර්ය ශක්තිය (3) ජලවිදුලිය (4) භූතාපය

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, ඉතිරි ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01)A පහත රූපයේ දැක්වෙන්නේ ද්විබීජපත්‍රී ශාක පුෂ්පයක දික්කඩකි.




(i) මෙහි a, b, c, d නම් කරන්න. (ල. 02)

(ii) b කොටස වර්ණවත්ව පිහිටන පුෂ්ප බහුලව දක්නට ලැබේ. එයින් පුෂ්පවලට ඇති වාසිය කුමක් ද? (ල. 01)

(iii) බොහෝ පුෂ්පවල කොළපාටින් පිහිටන පුෂ්ප කොටස කුමක් ද? (ල. 01)

(iv) පුමංගයේ කොටස් නම්කල රූප සටහනක් අඳින්න. (ල. 02)

B සමහර ශාක, බීජ වලින් පමණක් නොව වෙනත් ශාක කොටස් මගින් ද නව ශාක බිහිකරයි.

(i) ශාක පත්‍ර මගින් නව ශාක හටගන්වන ශාකයක නම ලියන්න. (ල. 01)

(ii) වායුධර මුල් හෙවත් ශ්වසන මුල්වල කාර්යය කුමක් ද? (ල. 01)

(iii) ද්විබීජ පත්‍රී ශාක මූල පද්ධතියක සරල සටහනක් අඳින්න. (ල. 01)

(iv) සංයුක්ත පත්‍ර ලෙස හඳුන්වන ශාක පත්‍රවල විශේෂත්වය ලියන්න. (ල. 01)

(v) හොර බීජ පැතිරී යන්නේ කුමන මාධ්‍යයක් මගින් ද? (ල. 01)




C (i) නල දෙකෙහි අඩංගු ද්‍රව්‍ය මිශ්‍රකල විට ඇතිවන වර්ණය ලියන්න. (ල. 01)

(ii) මෙහි දී වදමල් යුෂ කුමන ද්‍රව්‍යයක් ලෙස ක්‍රියාකර තිබේ ද? (ල. 01)

(iii) ඉහත නිරීක්ෂණයට අනුව එළඹිය හැකි නිගමනය කුමක් ද? (ල. 01)

(iv) විද්‍යාගරයේ දී හමුවන දෙහියුෂවල ගුණ ඇති වෙනත් ද්‍රව්‍යයක නම ලියන්න. (ල. 01)

(v) දෙහි යුෂ නිල් ලිට්මස් මගින් පරීක්ෂා කළහොත් ලැබෙන නිරීක්ෂණය කුමක් ද ? (ල. 01)

(මුළු ලකුණු 16)

(02) A පහත රූපයේ දැක්වෙන්නේ ද්‍රව්‍ය දෙකක් එකිනෙකට පිරිමැදි අවස්ථාවකි.

මෙම ද්‍රව්‍ය ටිකවේලාවක් එකිනෙක පිරිමැද වීදුරු දණ්ඩ කුඩා කඩදාසි කැබලි කිහිපයකට ලං කරන ලදී.




(i) එහිදී ලැබුණු නිරීක්ෂණය කුමක් ද? (ල. 01)

(ii) එම නිරීක්ෂණය ඇතිවීමට හේතුව ලියන්න. (ල. 01)

(iii) පිරිමැදීමෙන් සේද රෙදි කැබැල්ලට ලැබෙන ආරෝපණ වර්ගය කුමක් ද? (ල. 01)

(iv) මෙලෙස අරෝපණය කළ වීදුරු දණ්ඩක් පහත ලෙස නිදහසේ එල්ලා ඇත.




රූපයේ පරිදි විකර්ෂණය සිදුවීමට *x* දණ්ඩේ තිබිය යුතු ආරෝපණ වර්ගය කුමක් ද? (ල. 01)

(v) මෙසේ විකර්ෂණය වීමට හේතුව පැහැදිලි කරන්න. (ල. 01)

B පහත රූපයේ දැක්වෙන පාසල් විද්‍යාගාරයේ සැකසූ ඇටවුමකි.




(i) මෙහි x හා y නම් කරන්න. (ල. 02)

(ii) මෙහි x භ්‍රමණය කරනවිට මිලි ඇමීටරයේ දර්ශකයේ ඇතිවන නිරීක්ෂණය ලියන්න. (ල. 01)

(iii) එම නිරීක්ෂණයට අනුව නිපදවී ඇත්තේ කුමන වර්ගයේ විදුලි ධාරාවක් ද? (ල. 01)

(iv) එම විදුලි ධාරාව වියලි කෝෂයකින් හටගන්නා විදුලි ධාරාවට වඩා වෙනස් වන්නේ කෙසේ ද? (ල. 02)

(මුළු ලකුණු 11)

(03) A පහත රූපයේ දැක්වෙන්නේ ශිෂ්‍යයෙක් සෑදූ සරල ඇටවුමකි.




(i) මෙම බෝතලයෙන් අඩක් උණු ජල භාජනයක ගිල්වා තැබුවහොත් ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ල. 01)

(ii) නිරීක්ෂණයට හේතුව පැහැදිලි කරන්න. (ල. 02)

(iii) ඉහත ක්‍රියාකාරකමේ දී වීදුරු බෝතලයට ඇතුලු වූ ශක්තිය කුමක් ද? (ල. 01)

(iv) කඳුකර ප්‍රදේශයක ජලාශයක ජලයේ අඩංගු ශක්තිය කුමක් ද? (ල. 01)

(v) ගලායන ජලයේ අඩංගු ශක්තිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් ලියන්න. (ල. 01)

B පහත දැක්වෙන්නේ පරිසරයේ හමුවන සතුන් කිහිපදෙනෙකුගේ නම් වේ.

පිඹුරා, පසැඟිල්ලා, ගැඩවිලා, ඉබ්බා, වව්ලා

(i) මොවුන් අතරින් කශේරුවක් නොමැති සතුන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල. 02)

(ii) පාද නොමැති උරගයා නම් කරන්න. (ල. 01)

(iii) වේශාන්තරණය යන්න හඳුන්වන්න. (ල. 02)

(මුළු ලකුණු 11)

(04) (a) ආහාර ජීර්ණ පද්ධතියේ අවයව (අ) තීරයෙන් ද එම අවයව වලට අදාළ ක්‍රියාවලි (ආ) තීරයෙන් ද තෝරා එයට අදාළ අක්ෂරය අදාළ හිස්තැන මත යොදන්න.

| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| (i) | මුඛකුහරය | ( ) | A | ජලය අවශෝෂණය කරයි. |
| (ii) | අන්නස්‍රෝතය | ( ) | B | ජීර්ණය වූ ආහාර අවශෝෂණය කරයි. |
| (iii) | ආමාශය | ( ) | C | ආහාර තාවකාලිකව ගබඩා කරයි. |
| (iv) | ක්ෂුද්‍රාන්ත්‍රය | ( ) | D | මුඛයේ සිට ආහාර ආමාශයට ගමන් කරවීම. |
| (v) | මහාන්ත්‍රය | ( ) | E | ආහාර කුඩා කැබලි බවට පත් කරයි. (ල. 05) |

(b) පහතින් දී ඇති පිළිතුරු අතුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඔක්සිජන්, නයිට්‍රජන්, මධ්‍ය ගෝලය, ස්තර ගෝලය, ඇස්බැස්ටස් කුඩු, පොසිල ඉන්ධන, අම්ල වැසි)

(i) වායු ගෝලයේ වැඩිපුරම ඇති වායුව කුමක් ද? (ල. 01)

(ii) වායුගෝලයේ ඇති සිසිල්ම ස්තරය හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(iii) පරිසර දූෂණය ඇති කරන අංශුමය දූෂණකය කුමක් ද? (ල. 01)

(iv) බලශක්තිය ලබා ගැනීමට යොදා ගනී. වායු දූෂණයට හේතු වේ. (ල. 01)

(v) ඕසෝන් ස්තරය පිහිටා ඇත්තේ මෙම වායු ස්තරයේ ය. (ල. 01)

(vi) වායුමය දූෂණය නිසා ඇතිවන පාරිසරකි අර්බුදය කුමක් ද? (ල. 01)

(මුළු ලකුණු 11)

(05) අ (i) මධ්‍යසාරවල තාපාංකය සෙල්සියස් අංශක 77 ලෙස සඳහන් කර ඇත. මෙයින් අදහස් වන දේ ලියන්න. (ල. 01)

(ii) සෙල්සියස් අංශක 80 දී මධ්‍යසාර පවතින්නේ කුමන භෞතික අවස්ථාවක ද? (ල. 01)

(iii) මධ්‍යසාර ද්‍රව්‍යයක් ලෙස පවතින උෂ්ණත්වය සෙල්සියස් පරිමානයට අනුව ලියන්න. (ල. 01)

(iv) රසදිය උෂ්ණත්වමානයක් පරිහරණයේ දී අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ල. 02)

(v) වෛද්‍ය උෂ්ණත්වමානයක කේෂික නලයේ නැම්මක් දක්නට ලැබෙන්නේ ඇයි ? (ල. 01)

(ආ) ශිෂ්‍යයෙක් විසින් සකසන ලද ශ්වසන පද්ධතියේ ආදර්ශ ආකෘතියක් පහත දැක්වෙයි.




(i) බැලුම් පටලයෙන් අල්ලා පහතට ඇදීමේ දී බැලුන සම්බන්ධ නිරීක්ෂය ලියන්න. (ල. 01)

(ii) ඉහත ක්‍රියාවලියෙන් ආදර්ශනය වන්නේ ආශ්වාස ක්‍රියාවලිය ද? ප්‍රාශ්වාස ක්‍රියාවලිය ද? (ල. 01)

(iii) මෙහි බැලුම් පටලය හා බැලුම් ශ්වසන පද්ධතියේ කුමන කොටස් වලට සමාන වේ ද? (ල. 02)

(iv) එදිනෙදා ජීවිතයේ දී වේගයෙන් ශ්වසනය කරන අවස්ථාවක් ලියන්න. (ල. 01)

(මුළු ලකුණු 11)

(06) ශිෂ්‍ය කණ්ඩායමක් බෝතල් තුනකට ලබා ගත් පස් සාම්පල් 03 ක් A B C ලෙස නම් කරන ලදී. ඉන් පසු මෙහි ලක්ෂණ ඒ යටතේ වගු ගත කරන ලදී.

| A පස් සාම්පලය | B පස් සාම්පලය | C පස් සාම්පලය |
|---|---|---|
| කලු පැහැතිය | ඇලෙන සුළුය | රළු වයනයකි |
| කුඩා ජීවීන් බහුලය | වැලි කැට අඩුය | ජලය නොරදයි |
| ගඳක් වහනය විය | සිනිඳු වයනයකි | පැහැදිලි වර්ණයකි |
| | ගුලියක් සැදිය හැකිය | |

(i) ABC අතුරින් වැලි පස හා මැටි පස දක්නට ලැබෙන්නේ කිනම් පස් සාම්පල්වලද? (ල. 02)

(ii) ක්ෂුද්‍රජීවීන් හඳුනාගැනීමට සුදුසු පස් වර්ගය කුමක් ද? විද්‍යාගාරයේ දී ඒ සඳහා යොදා ගත හැකි උපකරණයක නම ලියන්න. (ල. 02)

(iii) කාබනික වගාවේ දී කොම්පෝස්ට් පොහොර ලෙස යොද ගත හැකි පස්වර්ගය කුමක් ද? (ල. 01)

(iv) මඩ සහිත ගෙමිදුලකට දැමීම සඳහා වඩාත් යෝග්‍ය පස කුමක් ද? ඒ සඳහා ඔබ තෝරාගත් පසේ කුමන ලක්ෂණය බලපායි ද? (ල. 02)

(v) ඔබේ ගෙවත්තෙන් A පස් සාම්පලයක් සොයා ගැනීමට අවශ්‍යනම් ඒ සඳහා වඩාත් සුදුසු ස්ථානයක නම ලියන්න. (ල. 01)

(vi) A පස් සාම්පලයේ පියවි ඇසට නිරීක්ෂණය වන කුඩා ජීවීන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල. 02)

(vii) B හි පස් සාම්පලයක් කැකෑරුම් නලයකට දමා රත්කල විට කැකෑරුම් නලයේ ඇතුල් බිත්ති මත අපේක්ෂා කළ හැකි නිරීක්ෂණය කුමක්ද? (ල. 01)

(මුළු ලකුණු 11)

(07) පහත දැක්වෙන වගුව පිටපත් කරගන්න. එහි දෙවන තීරුවේ පිළිතුර ලෙස පුනර්ජනය හෝ පුනර්ජනනීය නොවන යන වචන දෙකෙන් එකක් තෝරා දෙවන තීරුව මත ලියන්න.

(i)

| ශක්ති ආහාරය | පුනර්ජනනීය / පුනර්ජනනීය නොවන |
|---|---|
| උදාහරණ - ජල විදුලිය | පුනර්ජනනීය |
| ඛනිජ තෙල් | .................................... |
| ජෛව ස්කන්ධ | .................................... |
| භූ තාපය | .................................... |
| න්‍යෂ්ටික ශක්තිය | .................................... |
| ගල් අඟුරු | .................................... |

(ල. 05)

(ii) ජෛව ස්කන්ධ සඳහා උදාහරණයක් ලියන්න. (ල. 01)

(iii) පුනර්ජනනීය ශක්ති පරිහරණයේ ලැබෙන වාසි 02 ක් ලියන්න. (ල. 02

(iv) න්‍යෂ්ටික ශක්තිය නිපදවීමේදී ශ්‍රී ලංකාව මුහුණදෙන ගැටළුවක් සඳහන් කරන්න.(ල. 01)

(v) ශ්‍රී ලංකාව තුළ විදුලි බලය නිපදවීමට ගල් අඟුරු යොදා ගන්නා බලාගාරයක නම ලියන්න. (ල. 01)

(vi) LP ගෑස් භාවිත වෙනුවට දර යොදා ගැනීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලුවක් සඳහන් කරන්න. (ල. 01)

(මුළු ලකුණු 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 1 ) 03. ( 4 ) 04. ( 3 ) 05. ( 1 ) 06. ( 3 ) 07. ( 2 ) 08. ( 3 ) 09. ( 4 ) 10. ( 2 )

11. ( 3 ) 12. ( 3 ) 13. ( 1 ) 14. ( 2 ) 15. ( 4 ) 16. ( 3 ) 17. ( 2 ) 18. ( 3 ) 19. ( 3 ) 20. ( 2 )

## II කොටස

01. A (i) a කලංකය b දලපත්‍ර c මණිපත්‍ර d ඩිම්බකෝෂ (ල. 02)

(ii) පුෂ්පය වෙත සතුන් ආකර්ෂණය කර ගැනීමට (ල. 01)

(iii) මණිපත්‍ර / වෘත්තය (ල. 01)

(iv)




(ල. 02)

B (i) අක්කපාන / බිගෝනියා / කඩුපුල් වැනි ශාක එකකට (ල. 01)

(ii) මූල මණ්ඩලයට අවශ්‍ය වාතය ලබා ගැනීමට (ල. 01)

(iii) නිවැරදි රූප සටහනට (ල. 01)



(iv) පත්‍ර තලය සම්පූර්ණයෙන් බෙදී වෙන්වී තිබීම. (ල. 01)

(v) වාතය මගින් / සුළඟ මගින් (ල. 01)

C (i) රතු පැහැය ඇති වේ. (ල. 01)

(ii) දර්ශකයක් ලෙස (ල. 01)

(iii) දෙහියුෂ තුළ අම්ල අඩංගු බව / දෙහි යුෂ අම්ලයක් බව (ල. 01)

(iv) සුදුසු පිළිතුරකට (ල. 01)

(v) නිල් ලිට්මස් රතු පැහැ වේ. (ල. 01) (මුළු ලකුණු 16)

02 A (i) කඩදාසි කැබලි ආකර්ෂණය වේ. (ල. 01)

(ii) වීදුරු දණ්ඩෙහි ස්ථිති විද්‍යුත් ආරෝපණ හටගෙන තිබීම. (ල. 01)

(iii) ඍණ ආරෝපණ (ල. 01)

(iv) ධන ආරෝපණ / සජාතීය ආරෝපණ (ල. 01)

(v) සජාතීය ආරෝපණ එකිනෙකින් විකර්ෂණය වීම. (ල. 01)

B (i) x චුම්භකය

y කම්බි දඟරය (ල. 02)

(ii) දෙපසටම චලනය වීම (ල. 01)

(iii) ප්‍රත්‍යාවර්ත විදුලි ධාරාවක් (ල. 01)

(iv) සරල කෝෂයකින් නියත දිශාවකට ගලන සරල විදුලි ධාරාවක් හටගනී. නමුත් ඩයිනමෝවක හටගන්නේ දිශාව මාරුවෙමින් ගලායන ප්‍රත්‍යාවර්ත විදුලි ධාරාවකි. (ල. 02) (මුළු ලකුණු 11)

03 a (i) බැලුනය ක්‍රමයෙන් පිම්බී විශාල වීම. (ල. 01)

(ii) බෝතලය තුල තිබූ වාතය ප්‍රසාරණය වීම / පරිමාව වැඩි වීම. (ල. 02)

(iii) තාප ශක්තිය (ල. 01)

(iv) විභව ශක්තිව (ල. 01)

(v) ජල විදුලිය නිපදවීම / ප්‍රවාහනය වැනි සුදුසු පිළිතුරකට (ල. 01)

B (i) පසැගිල්ලා / ගැඩවිලා (ල. 02)

(ii) පිඹුරා (ල. 01)

(iii) තමන් ජීවත්වන පරිසරයට ගැලපෙන ලෙස ශරීර වර්ණය හෝ ස්වභාවය වෙනස්වීම වැනි සුදුසු පිළිතුරකට (ල. 02) (මුළු ලකුණු 11)

(04) (a) (i) E (ii) D (iii) C (iv) B (v) A (ල. 05)

(b) (i) නයිට්‍රජන් (ii) මධ්‍යගෝලය (iii) ඇස්බැස්ටස් කුඩු

(iv) පොසිල ඉන්ධන (v) ස්ථරගෝලය (vi) අම්ල වැසි (ල. 06) (මුළු ලකුණු 11)

(05) (අ) (i) මධ්‍යසාර ද්‍රව අවස්ථාවේ සිට වායු අවස්ථාවට පත්වන උෂ්ණත්වය (ල. 01)

(ii) වායු අවස්ථාවේ (ල. 01)

(iii) සෙල්සියස් 0 - සිට 77 ට අඩු ඕනෑම උෂ්ණත්වයක් (ල. 01)

(iv) නිවැරදි ක්‍රම 2 කට (ල. 02)

(v) රසදිය කඳ පහලට ගමන් කිරීම වැළැක්වීමට (ල. 01)

(ආ) (i) බැලුන් දෙකම පිම්බේ (ල. 01)

(ii) ආශ්වාස ක්‍රියාවලිය (ල. 01)

(iii) බැලන - පෙනහළුවලට, බැලුම්පටලය - මහාප්‍රාචීරයට (ල. 02)

(iv) ශරීරය කායිකව වෙහෙසවන අවස්ථාවක් දැක්වීමට (ල. 01) (මුළු ලකුණු 11)

(06) (i) C සහ B (ල. 02)

(ii) A, ආලෝක අන්වීක්ෂය (ල. 02)

(iii) A (ල. 01)

(iv) C, ජලය නොරැඳීමේ ගුණය (ල. 02)

(v) කුණු ගොඩක් වැනි ස්ථානයක් (ල. 01)

(vi) කුමන හෝ නිවැරදි සතුන් දෙදෙනෙකු සඳහා (ල. 02)

(vii) ජල බිංදු (ජල වාෂ්ප වලට ලකුණු නැත.) (ල. 01) (මුළු ලකුණු 11)

(07) (i)

| | | |
|---|---|---|
| ඛනිජ තෙල් | - | පුනර්ජනනීය නොවන |
| ජෛව ස්කන්ධ | - | පුනර්ජනනීය. |
| භූ තාපය | - | පුනර්ජනනීය. |
| න්‍යෂ්ටික ශක්තිය | - | පුනර්ජනනීය නොවන |
| ගල් අඟුරු | - | පුනර්ජනනීය නොවන (ල. 05) |

(ii) දර / සත්ව ඇට වැනි පිළිතුරකට (ල. 01)

(iii) පරිසරය දූෂණය නොවීම, ලබාදායී වීම වැනි (ල. 02)

(iv) අපද්‍රව්‍ය කළමණාකරණය අපහසුවීම වැනි පිළිතුරකය (ල. 01)

(v) නොරොච්චෝලේ (ල. 01)

(vi) දුම් බැඳීම වැනි පිළිතුරකට (ල. 01) (මුළු ලකුණු 11)